සත්ත්ව විද්‍යාව

# මිනිසාට රස බොජුන් වන ගොළුබෙල්ලෝ



මුහුදු බෙල්ලා



ගොඩබිම ගොළුබෙල්ලා



දැල්ලා

**මහාචාර්ය ලක්ෂ්මන් වෛද්‍යසේකර**

එංගලන්තයේ නොරිච් හි "ඊස්ට් ඇන්ග්ලියා විශ්ව විද්‍යාලයේ" මා පර්යේෂණ කරන කාලයේ සෙනසුරාද දිනවල නගර මධ්‍යස්ථානයට ආහාර පාන දී බඩු ගැනීමට යෑම සිරිතක් විය. එතැන මාළු කඩ පිල් රැසක් විය. එහි කුඩා පීරිසිවල විකිණීමට ඇති දෙයකි. ඒ කරදිය ගොළුබෙලි මස් ය. මෙම ගොළුබෙලි මස් පීරිසි අතට ගෙන රස පාමින් බුදින නොරිච් වැසියන් දැකුම්කලු දර්ශනයක් විය. මෙම ආහාරය රසමුසු බොජුනක් ලෙස ගන්නා අප පවසන අය සුද්දන් ය. ගොළුබෙලි මස් බුදින මිනිසුන් ලෝකයේ පෙර අපර දෙදිග රටවල ම දක්නට ලැබේ.

ගොළුබෙලි මස් නැතහොත් මොලුස්කාවන්ගේ මස් කෑම ඈත අතීතයේ සිට පැවත එන්නකි. මේ මොලුස්කාවන්ගේ කටු, දත්ත එකතු කරන පොසිල පටුනයන් ය. මෙය එදා ජීවත් වූ ආදි මානවයා ද ආහාර ලෙස ගත් බව සැලකේ. අප රටේ පමණක් නොව උතුරු අප්‍රිකාවේ දස දහස් ගණනින් යුත් පොසිල බෙලිකටු අඩි 6 ක් පමණ වූ උස් කඳු ලෙස සොයාගෙන ඇත. මින් දක්වන්නේ එදා ජීවත්වූ මානවයින් මොලුස්කාවන් ආහාර ලෙස ගත් බව ය. පිලිපීනයේ පුරා විද්‍යා කැනීම්වලදී ලෙවාන් හි ලිපිඩන් පොයින්ට්වල "හුරි ගුහාවේ" මානවයා විසින් වසර 8000 සිට පැරණි කාලයේ මෙය සිදු කළ බව ය. එදා මෙම ගල් ගුහා පෙදෙසේ ජීවත් වූ දඩයක්කාරයන් හා එකතු කරන්නන් ලබාගත් දේ ලෙස ය. ඔවුනගේ ආහාර ලෙස බැඳි දෙයක් ය.මේ අතර මෙම පෙදෙසේ ජීවත් වූ අතිකුන් දඩයම් කරන ලද සතුනගේ ඇටකටු ද විය. අප රටෙහි ආදී මිනිසුන් ජීවත් වූ ලෙස සැලකෙන "බුන්දල" වැනි තැන් නිදසුන් ය. එහි තිබී සොයා ගත් පොසිල බෙලිකටු තට්ටු ගැන පර්යේෂණ කරන ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ආචාර්ය කටුපොත පවසන්නේ වසර 5000 කට වඩා පැරණි බව ය. තව ද අපට පෙනෙන අයුරු වැසි කාලයේ දී වතාන්තරවලට ද ගොස් කළ බව පෙන්වන පරිදි ම මුහුදු තීරයේ බෙල්ලන් කවඩි වර්ග කැම්බීම සඳහා විශේෂ විධි යොදා ගත් බව ද පෙනේ. රෝමවරු, ක්‍රිස්තු පූර්ව 54 දී පමණ 'පොම්පේ' යුද්ධයේ දී ග්‍රාමීයස් ලිපිනස් නම් ගොළුබෙලි ගොවිපළක් තබා ගත් බව ද සඳහන් වී ඇත. දේශාන්තර තරණය කිරීමේදී නැව්වල ගොළුබෙලි ආහාර තබා ගත් බව පෙනේ. මෙහි දී එකල කන්‍යාරාම වැනි තැන්වල ද කුඩා ගොවිපළවල් තිබී බව ද සඳහන් වේ. ලෝක යුද සමයේ ද මෙවැනි සිදුවීම් සහ ගොළුබෙලි ආහාර තිපද වූ බව පෙනේ.

එදා මෙන් නොව අද ප්‍රංස අවන්හල්වල එස්කාගොට් ද බෝර්ගොග්නි Escargot de Bourgogne යන නමින් කෑමක් ලෙස ගනී. වැඩි වශයෙන් හෙලික්ස් වර්ගයේ Helix pomatia ගොළුබෙල්ලන් ගන්නා අතර හෙලික්ස් විශේෂ කීපයක් ම යොදා ගනී. පිලිපීනයේ පමණක් මෙය පිටරටවලට යවා ඩොලර් දහස් ගණනක් පමණ විදේශ විනිමය උපයා ගෙන ඇත. 'එස්කාගට්' නම් කුඩා ටින් එකක මිල ඩොලර් 7 ක් පමණ වේ. යුරෝපා රටවල දිළිඳු මිනිසුන් ලිටොරිනා Littorina ලිවොන Livona හා ස්ට්‍රොම්බස් Strombus ගොළුබෙලි වර්ග ආහාර ලෙස යොදා ගනී. තවත් භෞමික ගොළුබෙලි වර්ගයක් වන ඇකමීනා නැතහොත් අපේ කලුතර ගොළුබෙල්ලා අප්‍රිකා රටවල ආහාරයට ගනී. බටහිර යුරෝපීය රටවලට මෙය අපනයනය කෙරේ. පිලිපීනයේ යොදා ගත් වෙළෙඳ නාමය 'බයුකු'Bayuku යන්න ය. පිලිපීනයේ මිරිදිය ගොළුබෙලි වර්ග ද ආහාරයට ගනී. 'පිලා' නම් කුඹුරුවල වෙසෙන ගොළුබෙල්ලන් සහ 'විව්පරා' ගැමි මිනිසුන්ගේ ආහාරයක් ලෙස සලකති. භෞමික ගොඩබිම ජීවත්වන ගොළුබෙල්ලන්ගේ ගොවිපළවල් ද ඇත. ප්‍රංසයේ හා ඉතාලියේ ආහාර සඳහා ගන්නා ගොළුබෙලි වර්ග හිඟවීම නිසා කුඩා ගොළුබෙල්ලන් හතරැස් මිලි මීටර් 200ක පමණ වගා බිම්වල වගා කර ඇත. අවශ්‍ය ප්‍රමාණයට ලොකු වන ගොළුබෙල්ලන් විකිණීම සඳහා ගනී. තවද ලොකු ගොවිපළවල් ජර්මනියේ, ඉන්දියාවේ, ඉන්දුනීසියාවේ, තායිලන්තයේ සහ පිලිපීනයේ ද ඇත. මෙම සතුන්ගේ ආහාර ලෙස බතල වගාව ආශ්‍රිත බතලකොළ යොදා ගනී.

මෙම ගොඩබිම ජීවත් වන ගොළුබෙලි වර්ග මෙන් ම කරදිය ගොළුබෙලි වගාව ද සිදු කරයි. මේ අතර 'අබලොන්' නොහොත් 'හැලියොටිස්' විශේෂ තැනක් ගනී. ටැස්මේනියාවේ, ඕස්ට්‍රේලියාවේ, ජපානයේ, පිලිපීනයේ වගා කරති. පිලිපීනයේ ස්ට්‍රොම්බිස් නැමති හක්බෙල්ලන් ද වගා කරයි. මිරිදිය ගොළුබෙලි වර්ග ද වගා කරන තැන් අතුරින් විව්පරා හා පිලා වර්ග වේ. අග්නිදිග ආසියාවේ වී ගොවිතැනට හානිකර සතෙක් ලෙස සැලකෙන පොමේසියා ගොළුබෙලි විශේෂ මිනිස් ආහාරයට මෙන් ම සත්ත්ව ආහාරයට ද යොදා ගනී.තවද තාරාවන්ගේ ආහාරයක් ලෙස ද යොදා ගනී.

අප රටෙහි සමහරුනට මෙය අමුතු දෙයක් විය හැක. සත්ත්ව ලෝකයේ මෙම ගොළුබෙලි වර්ග අයත් වන්නේ මීට වසර මිලියන 1500 කට පමණ පෙර පරිණාමය වූ අදටත් ජීවත්වන මොලුස්කාMolluscaවංශයට අයිති අපෘෂ්ඨවංශිකයන් ය. ගොළුබෙල්ලන් ලෙස අප සලකන ගැස්ට්‍රොපොඩාGastropoda වර්ගයට අයත් ය. තවත් මොලුස්කා වංශික වර්ගයක් වන පොලිසිපොඩාPelecypodaවර්ගයට අයත් වන්නේ ලක් වැසියන් මස් ආහාරයට ගන්නා මුහුදු බෙල්ලන් හා මට්ටියන් ය. මොලුස්කාවන්ගේ තවත් වර්ගයක් වන සෙෆලොපොඩාCephalopodaවට අයත් සතුන් අපේ ආහාරයට ගනී. මේ දැල්ලන් හා මුදැල්ලන් ය. පිටරට ද යවා විදේශ විනිමය ලබා ගනී. මෙම සතුන් ද ගොළුබෙලි විශේෂයට අයත් ය. ආදී මිනිස්සු ගොළුබෙලි විශේෂ රාශියක මස් බුදින්නෝ වූහ. අපි ද ඉන් සමහරක් ආහාර ලෙස ගනිමු. මීට අවුරුදු මිලියන 1500 කට පෙර පරිණාමය වූ මෙම සතුන්ගෙන් අද ඉතිරිව ඇත්තේ සීමාසහිත ගණනක් වුවත් මානව සමාජයේ ගොළුබෙල්ලා සහ ඔවුනගේ සගයන්ට සීමා වූ තැන සුලුපටු නොවේ. ❑